# සමාජ සේවා නිලධාරීන්ගේ ස්ථාන මාරු පටිපාටිය

01. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009/02/20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව සමාජ සේවා නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පරිපාටිය

(PSC/EST/3/4/2013 හා 2015.01.29 දිනැති ලිපිය මගින් අනුමැතිය ලබා දෙන ලදි.)

02. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර

I. සේවාවේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලැබූ හා කිසියම් සේවා ස්ථානයක අවු. 02 සම්පූර්ණ කළ නිලධාරීන්ට ස්ථාන මාරු අයදුම් කළ හැක.

II. එකම ස්ථානයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් ස්ථාන මාරු වලට යටත්වේ.

03. ස්ථාන මාරු කමිටු සංයුතිය

I. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) - (සභාපති)

II. පරිපාලන නිලධාරී

III. සමාජ සේවා නිලධාරීන්ගෙන් අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත සෑම වෘත්තිය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක්

04. ස්ථාන මාරු සමාලෝචන කමිටු සංයුතිය

I. සමාජ සේවා අධ්‍යක්ෂ

II. අතිරේක අධ්‍යක්ෂ

III. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)

05. පොදු කරුණු

1) භාර්යාව හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුතු නම් ස්ථාන මාරු ඉල්ලීම් අනුව ස්ථාන මාරු කිරීමේ දී දෙදෙනාටම එකම ප්‍රදේශයක සේවය කරන්නට ඉඩ ලබාදීමට ස්ථාන මාරු කමිටුව හැකිතාක් උත්සාහ කළ යුතුය.

2) ආබාධ සහිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කාලත්‍රයන් වැනි පාලනයෙන් බැහැර මානුෂික හේතු සැලකිල්ලට ගත යුතුය.

3) ප්‍රියමනාප නොවන කාර්ය ස්ථානයන්ට ස්ථාන මාරු කිරීමේ දී පාසල් යන දරුවන් සිටින නිලධාරීන්ට වඩා අවිවාහක නිලධාරීන්, පාසල් නොයන දරුවන් සිටින නිලධාරීන් තෝරා ගැනීමට සැලකිලිමත් විය යුතුය.

CamScanner

4) ප්‍රියමනාප / ප්‍රියමනාප නොවන සේවා ස්ථාන තීරණය කිරීම හා සේවය කළ යුතු උපරිම / අවම සේවා කාලය තීරණය කිරීම සඳහා

4.1 සේවයේ අවශ්‍යතාවය

4.2 නිලධාරින්ගේ ඉල්ලීම

4.2.1 පාලන සීමාව තුළ

4.2.2 පාලන සීමාවෙන් බැහැරව

4.3 දුෂ්කර සේවයේ (ප්‍රියමනාප නොවන) යෙදී සිටි සේවා කාලය අනුව ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

(ස්ථාන මාරු කිරීමේ දී ලකුණු දීමේ විධිවිධාන අනුගමනය කරනු ලැබේ)

5).යම් සේවා ස්ථානයක නිලධාරියකුට සේවය කළ යුතු අනිවාර්ය සේවා කාලයක් නියම කර ඇත්නම් එම සේවා කාලයක් අනතුරුව ස්ථාන මාරු ඉල්ලීම් සැලකිල්ලට ගනු ලැබේ.

06. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | | |
|---|---|---|
| I. | ජුනි මස 30 දිනට පෙර | - වාර්ෂික ස්ථාන මාරු අයදුම් පත්‍ර කැඳවීම පිළිබඳව දැන්වීම නිකුත් කිරීම. |
| II. | ජුලි මස 31 දිනට පෙර | - සමාජ සේවා අධ්‍යක්ෂ වෙත වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් පත්‍ර භාරදීම. |
| III. | අගෝස්තු මස 10 දිනට පෙර | - සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන වාර්ෂික ස්ථාන මාරු අයදුම් පත්‍ර අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටුවට භාරදීම. |
| IV. | අගෝස්තු මස 31 දිනට පෙර | - වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ලිඛිතව භාර දීම. |
| V. | සැප්තැම්බර් මස 15 දිනට පෙර | - යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම නිකුත් කිරීම. |
| VI. | සැප්තැම්බර් මස 15 දිනට පෙර | - වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටුව පත් කිරීම |
| VII. | ඔක්තෝම්බර් මස 15 දිනට පෙර | - වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථානමාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ සමාජ සේවා අධ්‍යක්ෂ වෙත භාර දීම. |

CamScanner

VIII. නොවැම්බර් මස 01 දිනට පෙර - වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම

IX. එළඹෙන වසරේ ජනවාරි මස 01 දින සිට - වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක වේ.

07 ස්ථාන මාරු තීරණ වලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියා පටිපාටිය

1) ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියමයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි අංක 23 පරිශිෂ්ටයට ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේ ය. තව ද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනා සමඟ ඉදිරිපත් කිරීමට ද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

2) රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ සමාජ සේවා අධ්‍යක්ෂ මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි ආයතන ප්‍රධාන හා සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ද යොමු කළ යුතු වන්නේ ය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සමාජ සේවා අධ්‍යක්ෂකගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

3) සමාජ සේවා අධ්‍යක්ෂ විසින් කරන ලද ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියමය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේ ය. නියමිත කාලය තුළදී නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

4) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියළු ලිපි ගොනු ලිපි ලේඛන හා වාර්තා ආදියද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ ආයතන ප්‍රධාන හා සමාජ සේවා අධ්‍යක්ෂ වගබලා ගතයුතු වන්නේය. එසේ වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා නිරීක්ෂණ හා නිර්දේශ සමඟ දෙසැම්බර් මස 01 වන දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

5) මෙම නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

CamScanner

6) ඉහත 10 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7) ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ සමාජ සේවා අධ්‍යක්ෂ හා ආයතන ප්‍රධාන වෙත යවනු ලබන්නේය.

8) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයක් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 4 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි.

චන්දන රණවීර ආරච්චි
සමාජ සේවා අධ්‍යක්ෂ
සමාජ සේවා දෙපාර්තමේන්තුව
02 වන මහල, "සෙත්සිරිපාය" II අදියර,
බත්තරමුල්ල.

සමාජ සේවා අධ්‍යක්ෂ

සමාජ සේවා දෙපාර්තමේන්තුව